අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/68/02/54(II)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2021.01.07

චක්‍රලේඛ අංකය : 01/2021

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

<u>ආදර්ශ අත්සන් හා නිල මුද්‍රා තොරතුරු ලබාදීම.</u>

01. ශ්‍රී ලාංකීය රාජ්‍ය ආයතන විසින් නිකුත් කරනු ලබන ව්‍යවස්ථාපිත ලේඛන, බලපත්‍ර හා විවිධ වූ සහතිකපත් විදේශීය රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හා විදේශීය ආයතන වෙත ඉදිරිපත් කිරීමට පෙර විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය මඟින් සත්‍යාපනය සිදුකරයි.

02. ඉහත කාර්යය අඛණ්ඩව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා, ස්ථාන මාරුවීම් හා නව පත්වීම් ක්‍රියාවලිය සිදුකරන අවස්ථාවේ දී, පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලයන්හි සේවයේ නියුතු වන, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ මෙන්ම, බලයලත් අනෙකුත් නිලධාරීන්ගේ ආදර්ශ අත්සන් හා නිල මුද්‍රා තොරතුරු නොපමාව යාවත්කාලීන කළයුතුව ඇත.

03. පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලයන්හි සේවයේ නියුතු වන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ මෙන්ම බලයලත් අනෙකුත් නිලධාරීන්ගේ ආදර්ශ අත්සන් හා නිල මුද්‍රා තොරතුරු, ස්ථාන මාරුවීම් හා නව පත්වීම් ක්‍රියාවලිය සිදු කරන අවස්ථාවේ දී යාවත්කාලීන කිරීම සඳහා, මේ සමඟ අමුණා ඇති තොරතුරු ඇතුළත් කළයුතු ආකෘති පත්‍රය පුරවා දින 14 ක් ඇතුළත විදේශ සම්බන්ධතා අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත සාමාන්‍ය තැපෑලෙන් හා විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

04. යාවත්කාලීන ආදර්ශ අත්සන් හා නිල මුද්‍රා තොරතුරු යොමු කළයුතු විද්‍යුත් ලිපිනය හා ෆැක්ස් අංක පිළිවෙලින් පහත පරිදි වේ.

විද්‍යුත් තැපැල : signatures.consular@mfa.gov.lk
ෆැක්ස් අංක : 0112473899/2385571

05. ආදර්ශ අත්සන් හා නිල මුද්‍රා තොරතුරු අඛණ්ඩව ලබාදීම සම්බන්ධයෙන් ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා කරමි.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය